**ලංකා විදුලිබල මණ්ඩලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

මෙම වාර්තාවේ 1.2 හා 1.3 ඡේදවල දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ සහ එහි පරිපාලිතයන්හි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.2.1 සීමාසහිත ලංකා විදුලි ( පුද්ගලික ) සමාගම (ලංවිස)

ලංකා විදුලි බල මණ්ඩලයට 55% ක හිමිකම් ඇති එහි පරිපාලිත සමාගමක් වූ ලංකා විදුලි සමාගමේ විගණකවරු පහත සඳහන් පරිදි සමූහයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ විගණන මතයක් ප්‍රකාශ කර තිබුණි.

ප්‍රමාණවත් තොරතුරු ලබාගැනීමට නොහැකිවීම හේතුකොට ගෙන වර්ෂය අවසානයට දේපල, පිරියත හා උපකරණ යටතේ ඇතුළත් කර ඇති රු.මිලියන 590 ක් වූ ( දළ වශයෙන් ) යටිතල - කෙරීගෙන යන වැඩ ශේෂය පිළිබඳ නිරවද්‍යතාවය හා සම්පූර්ණත්වය විගණකවරුන්ට තහවුරු කර ගැනීමට නොහැකි විය.

(අ) දේපල පිරියත හා උපකරණ යටතේ දැක්වෙන රු.මිලියන 16 ක් වූ " සැපයුම් යටිතල " සමාගමේ ණයකරුවන් විසින් නියම කරන ලද සම්මත සූත්‍රයක් යොදා ගනිමින් දක්වා ඇති බව බව අනාවරණය විය. එම වත්කම් වල සාධාරණ අගය මෙම ප්‍රත්‍යාගණන ක්‍රමය මගින් නිරූපණය නොවේ. එමගින් දේපල , පිරියත හා උපකරණ, ප්‍රත්‍යාගණන

අතිරික්තය හා අදාළ ක්ෂය කිරීම් වලට වූ කිසිදු බලපෑමක් තහවුරු කර ගත නොහැකි විය.

(ආ) කැළණිය හා ගාල්ල ශාඛාවල ලෙජර ශේෂ පිළිවෙලින් රු.මිලියන 18 කින් හා රු.මිලියන 5 කින් බිල් කිරීම් පද්ධති ශේෂ ඉක්මවා තිබුණු අතර කළුතර ශාඛාවේ බිල් කිරීම් පද්ධති ශේෂය රු.මිලියන 8 කින් ලෙජර ශේෂය ඉක්මවා තිබුණි. ප්‍රමාණවත් තොරතුරු ලබාගැනීමට නොහැකිවීම හේතුකොට ගෙන මෙම ශේෂ පරික්ෂා කළ නොහැකි විය.

(ඇ) ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබුණු සනාථ කිරීමට අනුව ගෙවිය යුතු ශේෂය රු.මිලියන 14 කින් ලෙජරයේ ශේෂය සමඟ එකඟ නොවන අතර ඒ සඳහා සතුටුදායක පැහැදිලි කිරීමක් ලැබී නොතිබුණි. තවද රු.මිලියන 9 ක් වූ ලැබිය යුතු ශේෂය සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලයෙන් සනාථ කිරීමක් ලැබී නොතිබුණි.

### 1.2.2 සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ග්ස් ( පුද්ගලික ) සමාගම

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගමේ සහ එහි පරිපාලිත සමාගම්වල ඒකල මූල්‍ය ප්‍රකාශන එකඟවූ පරිදි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වර්ෂය තුළ සංස්ථාපනය කරන ලද " සීමාසහිත පවන් දනව් ( පුද්ගලික ) සමාගම " නමින් නව පරිපාලිත සමාගමක් ඇති කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් ලබාදී ඇති එකගතාවය විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

### 1.2.3 ඒකාබද්ධ කිරීමේ අඩුපාඩු

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්වෙන වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ පිළිබඳ සංචලනය සහ විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු මත පදනම්ව කරන ලද ගණනය කිරීම් අතර රු.මිලියන 122 ක වෙනසක් නිරික්ෂණය විය.

## 1.3 ලංකා විදුලි බල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 1.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රීලගිප්‍ර ) හා ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රීලංගිප්‍ර 5 - තොග : ප්‍රමිතියට අනුව පිරිවැය හා ශුද්ධ උපලබ්ධි වටිනාකමින් අඩු අගයට තොග ගණනය කළ යුතු අතර තොගවල පිරිවැය පිළිවෙලින් ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුතු (FIFO ) හෝ බර තැබූ සාමාන්‍ය පිරිවැය සූත්‍රය යොදා ගනිමින් නිකුත් කළ යුතුය. ප්‍රමිතියට පටහැනිව, මණ්ඩලය තම බෙදාහැරීම් කලාපවල ඇති තොග අගය කිරීම සඳහා සම්මත මිල යොදා ගෙන තිබුණි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කරන ලද නියෝග වලට අනුව මිල උච්චාවචනයට යටත් තොග අගය කිරිම සඳහා ප්‍රමිත පිරිවැය යොදා ගැනීමට ඉඩදිය හැකි අතර එසේ නොමැති නම් තොග වටිනාකම පිරිවැය හා ශුද්ධ උපලබ්ධි වටිනාකමින් අඩු අගයට ගණනය කළ යුතුය. පවත්නා තත්ත්වයට අනුව මිල ඉහළ යන නමුත් උච්චාවචනය නොවේ. මණ්ඩලය බොහෝ අවස්ථා වලදී තථ්‍ය ප්‍රමාණයට වඩා ඔවුන්ගේ සම්මත මිල අධි ඇස්තමේන්තුගත කර ඇති බව පැහැදිලි විය. උදාහරණයක් වශයෙන් 2011 වර්ෂයේදී ද්‍රව්‍ය මිල හා ශ්‍රම රේටයන් අධි ඇස්තමේන්තු කිරිමෙන් හඳුනාගත් ශුද්ධ ආදායම පිළිවෙලින් රු.මිලියන 2,920 ( 2010 - රු.මිලියන 1,785 ) ක් හා රු.මිලියන 803 ( 2010 - රු.මිලියන 548 ) ක් විය. එයට අමතරව ආදායම් ප්‍රකාශනයේ ආදායම් ලෙස හඳුනාගෙන තිබූ රු.මිලියන 1,255 ( 2010 - රු.මිලියන 962 ) ක මුදලක් පොදු කාර්ය පිරිවැය ( භාවිතා කළ තථ්‍ය ශ්‍රම පැය සඳහා යොදා ගත් ප්‍රමිත රේටයට ගණනය කළ ) ලෙස කාර්ය පිරිවැයට අයකර තිබුණි.

එහි ප්‍රතිඵලයක් ලෙස 2011 දෙසැම්බර් 31 දිනට තොග, කෙරීගෙන යන වැඩ , නඩත්තු හා නිම කරන ලද කාර්ය පිළිබඳ සාධාරණ අගය කිරීම ප්‍රශ්නගත වේ.

(ආ) ශ්‍රී ල ගි ප්‍ර 16 - සේවක ප්‍රතිලාභ - ප්‍රමිතියෙහි 120 ඡේදයේ දක්වා ඇති පරිදි ලංකා විදුලි බල මණ්ඩලයේ විශ්‍රාම අරමුදල සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) සංශෝධිත ශ්‍රී ලං ගි ප්‍ර 18 - දේපල පිරියත හා උපකරණ (PPE) ප්‍රමිතියට පටහැනිව ශ්‍රී ලංකා මහ බැංකුව වර්ෂය සඳහා ප්‍රසිද්ධ කරන ලද තොග මිල දර්ශකය, ආනයන අගය දර්ශකය හා දළ ජාතික නිෂ්පාදිත අනුපාතයෙහි වෙනස්වීම් පිළිබඳ ගණිතමය සරල සාමාන්‍ය මත පදනම්ව ගණනය කරන ලද රේටයට මණ්ඩලය එහි දේපල පිරියත හා උපකරණ (PPE) ඒවායේ ධාරණ අගය (Carrying Value ) ගුණ කිරීම මගින් වාර්ෂිකව ප්‍රත්‍යාගණනය කරයි.

තවද , අනුගමනය කරන ලද ක්‍රමයට අනුව , දේපල පිරියත හා උපකරණ ඒවායේ ඇස්තමේන්තුගත ආර්ථික ජීව කාලය දක්වා පමණක් ප්‍රත්‍යාගණනය කරමින් පැවතුණි. එයින් පසු වත්කම් වටිනාකම රු.1 ක නාමික අගයකට පවත්වා ගනිමින් ඒවායේ අපහරණය තෙක් දීර්ඝ කාලයක් එම වත්කම් භාවිතා කරමින් පැවතුණි.

ඊට අමතරව පහත දැක්වෙන තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

* විකිණීම සඳහා රඳවා තැබූ හෝ අපහරණය තුළ ඇතුළත් කළ ලෙස වර්ගීකරණය කළ වත්කම්
* තාවකාලික නිෂ්කාර්ය දේපල පිරියත හා උපකරණවල ධාරණ අගය

**(ඈ) ශ්‍රීලංගිප්‍ර 21 - විදේශ විනිමය අනුපාත වෙනස්වීමේ ප්‍රතිඵලය**

විදේශ අරමුදල් ව්‍යාපෘති මගින් මූල්‍යයනය කෙරෙන ප්‍රාග්ධන වත්කම් ඉදිකිරීම් පිළිබඳව කාල පරිච්ඡේදය තුළ පැන නගින ලද විනිමය හුවමාරු වෙනස්කම් සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තිය, මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ 2.3.1 ඡේදයෙහි හෙළිදරව් කරන ලද ප්‍රතිපත්තිය මගින් ආවරණය වී නොතිබුණි.

**(ඉ) ශ්‍රීලංගිප්‍ර 24 - රජයේ ප්‍රදාන හා රජයේ ආධාර ගිණුම්ගත කිරීම**

ග්‍රාමීය විදුලි බල සැපයුම් වැඩ සටහන් ඇතුළත් විදුලි බල උත්පාදනය, හුවමාරු කිරීම හා බෙදාහැරීම් වැඩ සටහන් සඳහා මණ්ඩලය විසින් ලද විදේශ ආධාර සහ ප්‍රාග්ධන ප්‍රදාන දීර්ඝ කාලයක් දායක ප්‍රාග්ධනය ලෙස සලකා තිබුණි. එසේ වුවද මහා භාණ්ඩාගාරය විසින් එවැනි සමහර ප්‍රදාන ප්‍රාග්ධන දායකය ලෙස සලකා නොතිබුණි. 2011 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, මණ්ඩලය සඳහා දායක වන ලද මුළු ප්‍රාග්ධනය රු.බිලියන 51 ක් වූ අතර මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.බිලියන 96 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය ප්‍රකාශන හා මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අතර රු.බිලියන 45 ක රජයේ ප්‍රදාන වෙනස සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල කරන ලද ගිණුම්කරණ ගැලපීම ප්‍රමිතිය සමඟ අනුකූලවී නොතිබුණි.

(ඊ) ශ්‍රීලංගිප්‍ර 41 - ස්ථාවර වත්කම් හානිකරණය ( Impairment ) - ප්‍රමිතියට අනුව හානිකරණ තක්සේරුවක් සිදුකර නොතිබුණි.

## 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) කාර්යයන් සඳහා යොදාගත් ශ්‍රමය හා පොදු කාර්ය පිරිවැය ප්‍රමිත පිරිවැයට අගය කිරිමේ ප්‍රතිඵලයක් ලෙස පැන නගින ලද එකතුව රු.මිලියන 4,979 ( 2010 - රු.මිලියන 3,295) ක් වූ සමස්ථ හිතකර ද්‍රව්‍ය මිල විචලනය, ශ්‍රම රේට විචලනය, පොදු කාර්ය විචලනය නඩත්තු හා ප්‍රාග්ධන කාර්යයන් අතර බෙදාහැරීමෙන් තොරව විකුණුම් පිරිවැයට හිලව් කර තිබුණි. එබැවින් වර්ෂය සඳහා දැක්වෙන පාඩුව හා ප්‍රාග්ධන කාර්යයන්හි වටිනාකම පිළිබඳ මූල්‍ය ප්‍රකාශන වලින් සත්‍ය තත්ත්වයක් පිළිබිඹු නොවේ.

(ආ) 2010 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ ඉදිරියට ගෙන එන ලද බදු පාඩුව රු.මිලියන 67,245 ක් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) රටේ විදුලි බල අංශ සංවර්ධනයන් සඳහා රජය විසින් ලබාගන්නා ලද විදේශ ආධාර ණය කිහිපයක් මණ්ඩලයට උප - ණය ලෙස ලබාදී තිබුණි. 2006 මාර්තු 01 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයට අනුව 2005 දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු.මිලියන 61,996 ක් වූ උප ණය වලින් 50% ක් ස්කන්ධයට මාරුකර තිබුණු අතර ශේෂය වන රු.මිලියන 30,998 ක් ඒකල ණයක් වශයෙන් සලකා තිබුණි. කෙසේ වුවද රජය විසින් පොලී අනුපාතය හා ආපසු ගෙවීම් ක්‍රමය සන්නිවේදනය කර නොතිබුණු බැවින් එම ණය නිරවුල් කිරීමෙන් තොරව පැවතුණු අතර කිසිදු පොලී ගාස්තුවක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. කෙසේ වුවද එම තත්ත්වය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) රු.මිලියන 17,447 ක් වූ ණය නිදහස් කිරිමේ ශේෂය හා රු.මිලියන 165 ක් වූ වෙනත් සංචිත ශේෂයෙන් ( විදේශ විනිමය සංචිත ලෙස වැරදියට නම් කරන ලද ) 2011 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන සංචිතය සමන්විත වේ. කෙසේ වුවද ස්වභාවය, කාර්යය ආදී විස්තර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඉ) ඉන්ෂුවරන්ස් එස්ක්‍රෝ අරමුදලේ ( Insurance Escrow Fund ) ආයෝජනයෙන් ජනනය වූ පොලී ආදායම , එස්ක්‍රෝ අරමුදලේ ආදායමක් ලෙස සැලකීමෙන් තොරව අරමුදල ආරම්භයේ සිටම මණ්ඩලයේ ආදායමක් ලෙස සලකා තිබුණි. උදාහරණයක් ලෙස සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 317 ක් වූ පොලී ආදායම ( 2010 වර්ෂයේ එය රු.මිලියන 404 ක් විය) මණ්ඩලයේ ආදායම් ලෙස සලකා තිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂය සඳහා මණ්ඩලයේ අලාභය හා 2011 දෙසැම්බර් 31 දිනට ඉන්ෂුවරන්ස් එස්ක්‍රෝ අරමුදලේ ශේෂය යන දෙකම සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) රු.මිලියන 3,047 ක් වූ වැඩ සටහන් ණය මුදලක් ලැබිය යුතු ශේෂයක් ලෙස සාක්ෂි නොමැතිව 2003 වර්ෂයේ සිට මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(උ) 2012 පෙබරවාරි 29 දින ආයු ගණක තක්සේරුකරුවකු විසින් කරන ලද තක්සේරුවට අනුව පාරිතෝෂික ගිණුම ගලපා නොතිබීම වර්ෂය සඳහා පාඩුව හා 2011 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වගකීම රු.මිලියන 480 කින් අඩුවෙන් දැක්වීමට හේතුවී තිබුණි.

(ඌ) 2011 වර්ෂයේදී මිලදීගත් පුනර්ජනනීය බලය සඳහා ගෙවිය යුතු රු.මිලියන 57 ක මුදලක් ගිණුම් ගත කර නොතිබුණ අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වර්ෂය සඳහා පාඩුව හා උපචිත වියදම් ශේෂය යන දෙකම සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දැක්වුණි.

(එ) “ වින්ඩ් පවර් " සමාගමට ගෙවිය යුතු රු.මිලියන 35 ක් වූ තීරු බදු ගැලපුම් ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පාඩුව හා ගෙවිය යුතු ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ඒ) ලංකා ඛනිජ තෙල් සංස්ථාව ( CPC ) විසින් ගනු ලැබූ තීරණයක් හේතුවෙන් 2011 ජූලි සිට සැප්තැම්බර් දක්වා කාල පරිච්ජේදය සඳහා ලීටරයකට එකඟ වූ රු.76 ක මිල ඉක්මවූ

ලේටයකට ගණනය කරන ලද ඉන්ධන පිරිවැය රු.මිලියන 1,369 ක් විදුලි බල උත්පාදන සමාගමකට ප්‍රතිපූර්ණය කර තිබුණි. අදාළ පාර්ශ්වයන් අතර විධිමත් එකඟතාවයක් නොමැතිව එම වැඩිපුර ගෙවීම අනුචිත ලෙස විකුණුම් පිරිවැය වලින් ඉවත්කර ලංකා ඛනිජ තෙල් සංස්ථාවෙන් ලැබිය යුතු ලෙස ගිණුම් ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සමාලෝචිත වර්ෂයේ පාඩුව හා වෙනත් ණයගැති ශේෂය පිළිවෙලින් සමාන ප්‍රමාණයකින් අඩුවෙන් හා වැඩියෙන් දැක්වුණි.

(ඔ) පුද්ගල ගිණුම් වලට බිල්පත්‍ර ඇතුළත් කිරීමට පෙර පාරිභෝගිකයන් විසින් මාසික බිල්පත්‍ර ගෙවීම නිරික්ෂණය වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස පාරිභෝගික පුද්ගල ගිණුම්වල සාවද්‍ය වැඩිපුර ගෙවීම් නිරූපණය විය. මෙම අඩුපාඩුව හේතුවෙන් 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වෙළඳ ණයගැතියන් රු.මිලියන 764 කින් අඩුවෙන් දක්වා තිබුණු අතර එම බැර ශේෂයෙන් රු.මිලියන 748 ක මාස තුනකට අඩු ලෙජරයේ ඇතුළත් කිරීමේ දෝෂයන් නිරූපනය විය.

(ඕ) සාමාන්‍යයෙන් , පෙර වර්ෂවල ආරම්භ කරන ලද කාර්යයන් සඳහා නිකුත් කරන ලද අතිරික්ත ද්‍රව්‍ය පසු වර්ෂ වලදී ගබඩාවලට ආපසු භාර දෙනු ලැබේ. කෙසේ වුවද වර්තමානයේ පවත්නා ක්‍රියාමාර්ගය අනුව එම ආපසු භාර දෙන තොග විෂයයන් නිකුත් කරන අවස්ථාවේ පවතින ලේටයන්ට අගය කිරීමෙන් තොරව වර්තමාන සම්මත ලේටයන්ට තොගයට ගනු ලබන අතර කෙරීගෙන යන වැඩද ඒ අනුව ගලපනු ලැබේ. එබැවින් , තොග හා කෙරීගෙන යන වැඩ ශේෂයන් යන දෙකම ඇතැම්විට අඩුවෙන් දැක්විය හැක. උදාහරණයක් වශයෙන් , 2011 වර්ෂයේ ලේටයන්ට අගය කරන ලද වයඹ පළාත් කාර්යාලයේ ගබඩා වලට භාරදී ඇති ඉන්වෙන්ට්‍රි විෂයයන් වල වටිනාකම රු.මිලියන 105 ක් විය.

(ක) වෙළඳ ණයගැතියන්ගේ හිඟ ශේෂ සඳහා මණ්ඩලයේ ප්‍රතිපත්තියට අනුව ප්‍රතිපාදන සැලසිය යුතු නමුත්, එසේ සලසා නොතිබූ බැවින් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වෙළඳ ණයගැතියන් හා පාඩුව රු.මිලියන 289 කින් වැඩියෙන් හා අඩුවෙන් දැක්වුණි.

| | මුදල<br>------<br>රු.මිලියන |
|---|---:|
| විගණනය විසින් සිදුකරන ලද ගණනය කිරීම් වලට අනුව මුළු ප්‍රතිපාදනය | 2,207 |
| මූල්‍ය ප්‍රකාශන අනුව මුළු ප්‍රතිපාදනය | 1,918 |
| ඌන ප්‍රතිපාදනය | 289 |

------------------------------------------------------------------------------------------------------------------------------------

(ග) වෙළඳ හා වෙනත් ණයහිමියන් සහ වෙළඳ හා වෙනත් ණයගැතියන් යටතේ එකතුව රු.මිලියන 327 ක හා රු.මිලියන 664 ක පිළිවෙලින් අසාමාන්‍ය හර හා අසාමාන්‍ය බැර ශේෂ ඇතුළත් කර තිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එම ණයගැතියන් හා ණය හිමියන් යන දෙකම එම ප්‍රමාණයන්ගෙන් අඩුවෙන් දැක්වුණි.

(ජ) මණ්ඩලයේ වයඹ පළාත් කාර්යාලයේ ( NWP) කෙරීගෙන යන වැඩ ගිණුමේ 2011 දෙසැම්බර් 31 දිනට බැර හා හර ශේෂයන් සහිත කාර්යයන් ඇතුළත්ව තිබුණි. වර්ෂය අවසාන ශේෂය තහවුරු කර ගැනීම සඳහා එම හර හා බැර ශේෂයන් එකට එකතු කිරීමේ හේතුවෙන් කෙරීගෙන යන වැඩ ගිණුම රු.මිලියන 40 කින් අඩුවෙන් දක්වා තිබුණි. 2011 දෙසැම්බර් 31 දිනට මාස තුනකට වැඩිකාලයක් එම බැර ශේෂයන් නිවැරදි කිරීමෙන් තොරව පැවතුණු බව තවදුරටත් නිරික්ෂණය විය.

(ච) 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන බෙදාහැරීම් කලාප - 3 හි ඉඩම් වටිනාකම ප්‍රත්‍යාගණනය කර නොතිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඉඩම් වටිනාකම රු.මිලියන 17 කින් අඩුවෙන් දැක්වුණි.

(ට) ගල් අගුරු බලාගාර ව්‍යාපෘතියේ රු.මිලියන 52,736 ක් වටිනාකම වූ ඉඩම්, කාර්යාල ගොඩනැඟිලි , හුවමාරු රැහැන් සහ උප කාර්යාල , වරාය පහසුකම් සඳහා ජෙටිය , බත්තල් හා ටග් බෝට්ටු , සේවක නිවාස සංකීර්ණ ආදි දේපල මණ්ඩලයට භාර ගෙන තිබුණු අතර 2011 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ අදියර 1 දැනටමත් ක්‍රියාත්මක කර තිබුණි. කෙසේ වුවද එම විෂයයන් අවම වශයෙන් කඩින්කඩ පදනම යටතේ හෝ ප්‍රාග්ධනිත කිරීමෙන් තොරව කෙරී ගෙන යන වැඩ ගිණුමේ අඛණ්ඩව පැවතුණි.

(ඩ) මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු රු.මිලියන 2,000 ක මුදලක් වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ යටතේ කාරක ප්‍රාග්ධනය සංචලනයක් ලෙස සැලකීමෙන් තොරව ගෙවූ ආදායම් බදු ලෙස මණ්ඩලයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අනුචිත ලෙස දක්වා තිබුණි.

(ණ) 2011 දෙසැම්බර් මාසයේදී ගෙවන ලද පාරිතෝෂික ( බෝනස් ) සඳහා උපයන විට ගෙවීම් බදු ප්‍රතිපාදනය නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන උපචිත වියදම අඩුවෙන් දැක්වුණි.

(ත) යාපනය කලාපයේ විදුලි බල සැපයුම පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ යාපනය කලාපයේ විදුලි බල පුනරුත්ථාපනය සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු රු.මිලියන 37 ක ප්‍රාග්ධන ප්‍රදානය මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු ණය ලෙස සාවද්‍යාව ගිණුම් ගත කර තිබුණු අතර එහි ප්‍රතිපලයක් ලෙස 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන දායක ප්‍රාග්ධනය හා මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු ණය පිළිවෙලින් එම ප්‍රමාණයෙන් අඩුවෙන් හා වැඩියෙන් දැක්වුණි.

### 1.3.3 නොසැසඳු වෙනස්කම්

පහත දැක්වෙන නොසැසඳු වෙනස්කම් නිරීක්ෂණය විය.

| | මූල්‍ය ප්‍රකාශනවල විෂයය | උපයෝගී වාර්තා | ශේෂය | | වෙනස |
|---|---|---|---|---|---|
| | | | මූල්‍ය ප්‍රකාශන අනුව | උපයෝගී වාර්තා අනුව | |
| | | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| (අ) | ලංකා විදුලි (පුද්ගලික) සමාගමෙන් ලැබිය යුතු | ලංකා විදුලි සමාගමේ මූල්‍ය ප්‍රකාශන | 1,628 | 1,736 | (108) |
| (ආ) | ලංකා විදුලි (පුද්ගලික) සමාගමට ලැබිය යුතු | ලංකා විදුලි සමාගමේ මූල්‍ය ප්‍රකාශන | - | 9 | (9) |
| (ඇ) | ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතියේ ( අදියර - 1) සඳහා දායක ප්‍රාග්ධනය | ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන | 3,586 | 3,570 | 16 |
| (ඈ) | දේපල, පිරියත හා උපකරණ කලාප - 3 | ස්ථාවර වත්කම් ලේඛන | 2,454 | 2,462 | (8) |
| (ඉ) | දේපල, පිරියත හා උපකරණ කලාප - 3 | පොදු ලෙජරය | 2,454 | 2,487 | (33) |
| (ඊ) | මෝටර් වාහන හා කාර්යාල උපකරණ සඳහා සමුච්චිත ක්ෂය | ස්ථාවර වත්කම් ලේඛන | 1,205 | 1,186 | 19 |
| (උ) | මෝටර් වාහන හා කාර්යාල | පොදු ලෙජරය | 1,205 | 1,219 | (14) |

| | | | | | |
|---|---|---|---|---|---|
| | උපකරණ සඳහා සමුච්චිත ක්ෂය | | | | |
| (ඌ) | ලංකා ගල් අඟුරු සමාගමෙන් (LCC) ලැබිය යුතු | ලංකා ගල් අඟුරු සමාගමේ මූල්‍ය ප්‍රකාශන - සටහන 13 | - | 11 | (11) |
| (එ) | වියදම් සඳහා අත්තිකාරම් - ලංකා ගල් අඟුරු සමාගම | ලංකා ගල් අඟුරු සමාගමේ මූල්‍ය ප්‍රකාශන - සටහන 13 (ලංචිම වියදම් අත්තිකාරම්) | - | 1,606 | (1,606) |
| (ඒ) | වෙළඳ ණයගැතියන් - කලාප 2 | බිල් සාරාංශය සහ කාල විශ්ලේෂණ (උපලේඛන ශේෂය ) | 1,906 | 1,956 | (50) |
| (ඔ) | කෙරී ගෙන යන වැඩ (ප්‍රාග්ධන - නොවන ) -කලාප 3 | වෙනත් ණයගැති කාල විශ්ලේෂණ | 110 | 86 | 24 |
| (ඕ) | වෙනත් ණයගැතියන්හි ඇතුළත් වෙනත් ණයගැතියන් - කලාප 3 | කාල විශ්ලේෂණ | 2,049 | 2,045 | 4 |
| | එකතුව | | | | (1,776) |

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බස්නාහිර පළාත දකුණ - II නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවල ලංකා විදුලි (පුද්ගලික ) සමාගමට අදාළව එකතුව රු.මිලියන 33 ක් වූ ලැබිය යුතු ශේෂ තුනක් හා එකතුව රු.මිලියන 27 ක් වූ ලැබිය යුතු ශේෂ තුනක් 2011 දෙසැම්බර් 31 දිනට දීර්ඝ කාලයක් තුළ නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි.

(ආ) 2008 ජනවාරි 24 දිනැති දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ ලිපියෙන් උපදෙස් දී ඇති පරිදි පසු වර්ෂ වලදී පැන නගින මණ්ඩලයේ බදු බැරකම්කට එරෙහිව නිරවුල් කිරීමෙන් තොරව රු.මිලියන 38 ක් වූ භාණ්ඩ හා සේවා බදු අතිරේක ගෙවීමක් ( GST) 2002 ජනවාරි සිට අයකර ගත යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනවිත් තිබුණි.

(ඇ) වර්ෂ 10 කට වැඩිකාලයක් හිඟ හිට පැවති කලාප 1 විදුලි බල ණයගැතියන්ගෙන් ලැබිය යුතු රු.මිලියන 447 ක් සඳහා කරන ලද සම්පූර්ණ ප්‍රතිපාදනය අයකර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව වර්ෂයෙන් වර්ෂය ඉදිරියට ගෙනවිත් තිබුණි.

(ඇ) රජය විසින් බොහෝ ප්‍රදාන හා සහායන් මෙන්ම මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය සඳහා සහනයන්ද ලබාදී ඇති බැවින් මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ලෙස වාර්තා කර ඇති රු.මිලියන 1,622 ක් වූ විදුලි බල ප්‍රතිදාන ලැබීම හා රු.මිලියන 3,451 ක් වූ විජී ලාම්පු සඳහා ලැබීම සැක සහිතය.

කෙසේ වුවද මේ සම්බන්ධයෙන් සභාපතිවරයාගේ හා සාමාන්‍යාධිකාරිවරයාගේ අදහස පහත පරිදි වේ.

" භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ඉහත ශේෂයන් අයකර ගැනීමේ හෝ භාණ්ඩාගාරයේ වෙනත් ගෙවීම් වලට එරෙහිව නිරවුල් කිරීමේ අරමුණින් ගිණුම්වල පවත්වාගෙන ඇත. එබැවින් භාණ්ඩාගාරය අදාළ තීරණය දැන්වුවොත් මිස භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු දැ සැක සහිත ලෙස සැලකිය නොහැක. "

(ඉ) 2008 ඔක්තෝබර් 24 දිනැති අංක 1572/25 දරන ගැසට් නිවේදනයේ 14 ඡේදයට අනුව විදුලි පරිභෝජනයට එරෙහිව මාස දෙකක් සඳහා එහි සියළු පාරිභෝගික**යන්ගෙන්** විදුලි පරිභෝජනය සඳහා තක්සේරු කරන ලද පිරිවැයට සමාන තැන්පතුවක් ලංකා විදුලි බල මණ්ඩලය විසින් ලබාගත යුතුය.

කෙසේ වුවද ප්‍රවර්ථන බිල් වටිනාකම පදනම් කර ගෙන තථ්‍ය මුදල තැන්පත් කිරීමට එරෙහිව තොග පාරිභෝගිකයන් සම්බන්ධයෙන් බෙදාහැරීම් කලාප - 1 හි තෝරාගත් පළාත් කාර්යාල දෙකක පවත්වා ගෙන යන තැන්පතු ප්‍රමාණවත් නොවූ බව අනාවරණය විය. පාරිභෝගිකයන් 149 දෙනෙකුගෙන් රු.මිලියන 470 ක හිඟයක් නිරීක්ෂණය විය. මීට අමතරව , කිසිදු ඇප තැන්පතුවක් නොමැතිව වෙනත් තොග පාරිභෝගිකයන් 29 දෙනෙකු සමඟ ගනුදෙනු කරමින් තිබුණු අතර 2011 දෙසැම්බර් 31 දිනට ඔවුන්ගේ හිඟ ශේෂය රු.මිලියන 10 ක් විය. ඒ අනුව , මණ්ඩලය විසින් එම පාරිභෝගිකයන් සමඟ ඉහළ ණය අවදානමක් සහිතව ගනුදෙනු කරමින් සිටින බව අනාවරණය විය.

(ඊ) කොළඹ නගර කාර්යාලයේ රු.මිලියන 225 ක් වූ සාමාන්‍ය සැපයුම් ණය ගැති ශේෂය 2011 දෙසැම්බර් 31 දිනට මාස 6 කට වැඩි කාලයක් හිඟව පැවති අතර එම ශේෂයෙන් 79% ක් විධිමත් අයකිරීම් ක්‍රියාමාර්ගයක් නොගැනීම හේතුවෙන් වර්ෂ 3 කට වැඩි කාලයක් හිඟව පැවතුණි.

(උ) මණ්ඩලයේ කොළඹ නගර කාර්යාලයේ කෙරීගෙන යන වැඩ ගිණුමේ දැක්වෙන 2011 ජනවාරි 01 දිනට වර්ෂ 4 කට වැඩි කාලයක් ඉක්මවූ ශේෂය රු.මිලියන 13 ක් පමණක් වූ බැවින් 2011 දෙසැම්බර් 31 දිනට වර්ෂ 5 කට වැඩි කාලයක් ඉක්මවූ ශේෂය රු.මිලියන 78 ක් විය නොහැකිය. එබැවින් කෙරීගෙන යන වැඩ ගිණුමේ කාල විශ්ලේෂණය පිළිබඳ නිරවද්‍යතාවය සැක සහිත බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඌ) 2011 දෙසැම්බර් 31 දිනට සීමාසහිත එල්ටීඑල් ට්‍රාන්ස්පෝමර්ස් ( මණ්ඩලයේ පරිපාලිත සමාගමක් ) සමාගමෙන් ලැබිය යුතු මුදල රු.මිලියන 11 ක් වූ අතර එම ශේෂය අයකර ගැනීමෙන් තොරව වර්ෂ තුනකට වැඩි කාලයක් හිඟව පැවතුණි.

(එ) ආගමික පරිශ්‍රයන්ගෙන් ලැබිය යුතු රු.මිලියන 2,418 ක මුදල 2011 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට වැඩි කාලයක් හිඟව පැවතුණි.

(ඒ) තොග පාරිභෝගිකයන් සඳහා සාමාන්‍ය ණය කාලය මාසයක් වේ. කෙසේ වුවද මණ්ඩලයේ නැගෙනහිර පළාත් කාර්යාලයේ තොග පාරිභෝගිකයන්ගේ රු.මිලියන 523 ක් වූ මුළු හිඟ ශේෂයෙන් රු.මිලියන 307 ක් 2011 දෙසැම්බර් 31 දිනට මාස තුනකට වැඩි කාලයක් හිඟව පැවතුණි. එබැවින් ණය පාලන පද්ධතිය අධීක්ෂණය කිරීම ඉතා දුර්වල බව නිරීක්ෂණය විය.

(ඔ) මණ්ඩලයේ නැගෙනහිර පළාත් කාර්යාලයේ රු.මිලියන 359 ක් වූ ණය හිමි පාලන ගිණුම් ( විදුලි ) ශේෂය 2011 දෙසැම්බර් 31 දිනට මාස තුනකට වැඩි කාලයක් නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි.

(ඕ) කලාප - 4 හි රු.මිලියන 168 ක් වූ ප්‍රාග්ධන - නොවන කෙරීගෙන යන වැඩ වලින් රු.මිලියන 34 ක් වූ කෙරී ගෙන යන වැඩ 2011 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට වැඩි කාලයක් තුළ නිම කර නොතිබුණි.

(ක) අත්තිකාරම් හා පූර්ව ගෙවීම් ගිණුම් ගත කිරීම සඳහා පොදු ක්‍රමයක් නොවූ අතර එකම කාර්යය සඳහා විවිධ ගිණුම් පවත්වා තිබුණි. තවද 2011 දෙසැම්බර් 31 දිනට නිරවුල් කිරීමෙන් තොරව මූල්‍ය ප්‍රකාශනවල දිගුකාලීන හිඟ අත්තිකාරම් හා පූර්ව ගෙවීම් ශේෂයන් නිරීක්ෂණය විය. 2011 දෙසැම්බර් 31 දින එම විවිධ ගිණුම්වල වූ රු.මිලියන 343.104 ක මුළු ලැබිය යුතු ශේෂයෙන් රු.මිලියන 281.888 ක මුදලක් වර්ෂයකට වැඩි කාලයක් තුළ අයකර ගෙන නොතිබුණි.

### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති තහවුරු සාක්ෂි නොමැතිවීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පහත විෂයයන් සම්බන්ධයෙන් වූ රු.මිලියන 8,732 ක මුදලක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු.මිලියන | |
| භාණ්ඩාගාර ණය | 1,200 | සම්බන්ධිත ලිපිගොනුව |
| බොල් හා අඩමාන ණය සඳහා ප්‍රතිපාදන | ලබාගැනීමට නොහැක. | කරන ලද නිශ්චිත ප්‍රතිපාදන පිළිබඳ විස්තරාත්මක ලැයිස්තුව |
| ඉවත් කළ ට්‍රාන්ස්ෆෝමර් ගිණුම - කොළඹ නගර කාර්යාලය | 160 | දීර්ඝ ප්‍රමාදයට හේතු සහ අය කිරීමට ගත් ක්‍රියාමාර්ග |
| වෙනත් ණයගැතියන් - කෙරීගෙන යන වැඩ, ප්‍රාග්ධන - නොවන | | |
| - කලාප 2 | 390 | |
| - මූලස්ථාන කාර්යාලය | 14 | |
| අත්තිකාරම් හා පූර්ව ගෙවීම් , තැන්පතු, ලං වි ම සේවකයන්ට ණය , වෙනත් ණයගැතියන් ආදිය (බස්නාහිර පළාත , උතුර ) | 2409 | විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ |
| කලාප - 2 හි වෙනත්ණයගැතියන් තුළ ඇතුළත් වෙනත් ණය ගැතියන් | 3,584 | |
| ලියා හළ ගබඩා වෙනස්කම් (බස්නාහිර පළාත , උතුර ) | 22 | විස්තරාත්මක උපලේඛන, අවශ්‍ය අනුමැතිය හා විමර්ශන වාර්තා ආදිය |
| කෙරීගෙන යන වැඩ - කලාප - 2 | 138 | විස්තරාත්මක උපලේඛන හා නිම කිරීමේ ප්‍රමාදයට හේතු |
| වෙනත් අංශයන්ට ( ඉහළ කොත්මලේ ව්‍යාපෘතියට ) මාරු කරන ලද නිම නොවූ ප්‍රාග්ධන වැඩ | 815 | මාරු කරන ලද විෂයයන් හා අංශ වල නම් පිළිබඳ විස්තරාත්මක උපලේඛන |
| එකතුව | 8,732 | |

(ආ) විදේශ / රජය /ලංවිම මුල්‍යයනය කෙරෙන හුවමාරු , බෙදාහැරීම් , උත්පාදන , හා වෙනත් ව්‍යාපෘති කිහිපයක් පැවතියද , ව්‍යාපෘති වල මූල්‍ය ප්‍රගතිය අධීක්ෂණය කිරීමට හැකි වන පරිදි සම්පූර්ණ විදුලි බල ප්‍රවේශය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ( Clean Energy Access Improvement Project ) සඳහා හැර ඉතිරි ව්‍යාපෘති සඳහා වෙනම ගිණුම් පවත්වා නොතිබුණි.

(ඇ) 2011 දෙසැම්බර් 31 දිනට මහා භාණ්ඩාගාරය විසින් ලබාදෙන ලද මුළු ණය සම්බන්ධයෙන් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන හා ශ්‍රී ලංකා ප්රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය ප්‍රකාශන අතර රු.මිලියන 108,769 ක වෙනසක් නිරික්ෂණය විය. තවද භාණ්ඩාගාරය විසින් ලබාදෙන ලද රු.මිලියන 6,146 ක් වටිනා ණය තුනක් සම්බන්ධයෙන් උප ණය ගිවිසුම් නොතිබු අතර ඒ හේතුවෙන් ආපසු ගෙවීම් ක්‍රමය හා එම ණය සඳහා පොලිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) සේවා සම්බන්ධන කාර්යයක් සඳහා ගන්නා සාමාන්‍ය කාලය මාස 6 සිට 9 දක්වා වේ. කෙසේ වුවද කොළඹ නගර කාර්යාලය ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව , ඔවුන්ගේ රු.මිලියන 450 ක් වටිනා කාර්යයන් 2011 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට වැඩි කාලයක් ඉක්මවා තිබුණි. එබැවින් අදාල කාර්යයන් නිම කර තිබුණු අවස්ථා වලදී ද සේවා ප්‍රධාන තැන්පතු පාරිභෝගික දායක ගිණුමට මාරු නොකිරීමේ හැකියාවක් තිබුණි. එබැවින් නිමකිරීමේ දීර්ඝ ප්‍රමාදයට හේතු හඳුනා ගැනීම සඳහා හා 2011 දෙසැම්බර් 31 දිනට පාරිභෝගික දායකය පිළිබඳ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා එම දිගුකාලීන හිඟ හිටි කාර්යයන් සම්බන්ධයෙන් විස්තරාත්මක විශ්ලේෂණ වාර්තාවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) මණ්ඩලයේ වයඹ පළාත් කාර්යාලයේ කෙරී ගෙන යන වැඩ ගිණුමේ රු.මිලියන 186 ක් හා රු.මිලියන 196 ක් පිළිවෙලින් වර්ෂ 2 සිට 5 දක්වා හා වර්ෂ 5 ට වැඩි කාල පරිච්ඡේදයක් තුළ නිරවුල් කිරීමෙන් තොරව ප්‍රධාන වශයෙන් නිම කිරීම් වාර්තා නොමැතිවීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩව දක්වා තිබුණි. ප්‍රමාදය සඳහා හේතු හඳුනා ගැනීමට විස්තරාත්මක විශ්ලේෂණ වාර්තාවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**1.3.6 නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

**(අ) 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත**

(i) 47(1)(අ) වගන්තිය - වගන්තියට අනුව මණ්ඩලයේ චංචල හා නිශ්චල දේපල වල රක්ෂණය ආවරණය කිරීමට සහ කම්කරු වන්දි ආඥා පනත යටතේ පැන නගින තුන්වන පාර්ශ්වයේ අවදානම් සහ වගකීම් දැරීමට මණ්ඩලය විසින් භාණ්ඩාගාරය සමඟ රක්ෂණ සංචිතයක් ස්ථාපිත කර පවත්වා ගත යුතු නමුත් එයට අනුකූලවී නොතිබුණි. කෙසේ වුවද මණ්ඩලයේ හානිවන දේපල පිරිවැය දැරීමට ස්වයං රක්ෂණ සංචිතයක් ඇති කර පවත්වා ගෙන ගොස් තිබුණු අතර 2011 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ ශේෂය රු.මිලියන 6,572 ක් විය.

(ii) 47(1)(ආ) වගන්තිය - වගන්තියට අනුව , මණ්ඩලය විසින් ලබාගන්නා ණය ආපසු ගෙවීමට අදාලව භාණ්ඩාගාරය සමඟ එක්ව නිදන් අරමුදලක් ( Sinking Fund ) ස්ථාපිත කර පවත්වා ගත යුතුය. ණය නිදහස් කිරිමේ සංචිතයක් තිබුණද, එය 2000 වර්ෂයේ සිට යාවත්කාලින කර නොතිබුණි. එම සංචිත ගිණුමේ ශේෂය ( වර්ෂය ආරම්භයේ ශේෂය ලෙස සාවද්‍යව සඳහන් කර තිබුණි. - යොමුව සටහන අංක 17.1 ) රු.මිලියන 17,447 ක් විය.

(iii) 47(2)(අ) වගන්තිය - වගන්තියට අනුව , මණ්ඩලයේ චංචල හා නිෂ්චල දේපල වල ක්ෂය ආවරණය කර ගැනීම සඳහා භාණ්ඩාගාරය සමඟ එක්ව ක්ෂය සංචිතයක් ස්ථාපිත කර පවත්වා ගත යුතුය. කෙසේ වුවද එම අවශ්‍යතාවයට පටහැනිව , මණ්ඩලය විසින් එහි මූල්‍ය ප්‍රකාශන වල 2000 දෙසැම්බර් 31 දක්වා වාර්ෂිකව රු.මිලියන 1 ක් මාරු කර ක්ෂය සංචිතයක් ගොඩනගා තිබුණු අතර එයින් පසු කිසිඳු සංචලනයක් සිදුවී නොතිබුණි. එම දිනට සමුච්චිත වී ඇති රු.මිලියන 23 ක ශේෂයක් වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනවිත් තිබුණි.

(iv) 47(2)(ආ) වගන්තිය - වගන්තියට අනුව , ආදායම් මුදල් වලින් ප්‍රාග්ධන වැඩ වලට මුල්‍යයනය කිරීමේ අරමුණ සඳහා , මණ්ඩලයේ මූල්‍ය ස්ථායිතාවය

සහතිකවීමට සහ මණ්ඩලය විසින් වරින්වර තීරණය කරනු ලබන වෙනත් එවැනි අරමුණු සඳහා මහා භාණ්ඩාගාරය සමඟ එක්ව මණ්ඩලය පොදු සංචිතයක් ස්ථාපිත කර පවත්වා ගත යුතුය. කෙසේ වුවද එම අවශ්‍යතාවයට පටහැනිව මණ්ඩලය විසින් එහි මූල්‍ය ප්‍රකාශන වල වෙනත් ප්‍රාග්ධන සංචිතයක් ගොඩනගා තිබුණු නමුත් එය 2000 වර්ෂයේ සිට යාවත්කාලීන කර නොතිබුණි. එම සංචිත ගිණුමේ ශේෂය රු.මිලියන 165.45 ක් විය.

(ආ) 1969 අංක 17 දරන විදුලිබල මණ්ඩල පනතේ 46 වගන්තියට හා 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටසේ 11 (අ) හා (ආ) වගන්තිවල විධිවිධාන වලට පටහැනිව 1989 වර්ෂයේ සිට එක් එක් වර්ෂය අවසානයට එහි දළ ස්ථාවර වත්කම් වල මුළු අගයට 0.1% ක දායකයක් පදනම් කර ගෙන 2011 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 3,710 ක්වූ අරමුදල් මණ්ඩලය විසින් ඉන්ෂුවරන්ස් එස්ක්‍රෝ අරමුදලේ ( Insurance Escrow Fund ) ආයෝජනය කර තිබුණි.

(ඇ) 1990 මාර්තු 09 දිනැති අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

(i) චක්‍රලේඛ උපදෙස් වල දක්වා ඇති පරිදි පුවත්පත් දැන්වීම් , ගැසට් නිවේදනයන් ආදිය මඟින් සුදුසුකම්ලාභී අයඳුම්කරුවන්ගෙන් දීප ව්‍යාප්ත ඉල්ලුම්පත් කැඳවීමෙන් තොරව ලංකා විදුලිබල මණ්ඩලය විසින් ලිපිකරුවන් , කැෂියර්වරුන් , ගබඩාකරුවන් , යතුරු ලියන්නන් , රියදුරන් , කාර්යාල සහායකයින් ආදි වශයෙන් නුපුහුණු හා අර්ධ පුහුණු කාර්ය මණ්ඩලය වාර්ෂිකව බඳවා ගෙන තිබුණි.

(ii) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.2 ඡේදයට අනුව සියළු රාජ්‍ය ව්‍යාපාරයන් සතුව සියළු ප්‍රධාන මෙහෙයුම් ආවරණය වන ක්‍රමානුකූලව සංශෝධනය වන හා යාවත්කාලීන කෙරෙන ස්වකීය පද්ධති / අත්පොත් තිබිය යුතුය. කෙසේ වුවද වර්ෂ 24 කට පෙර පිළියෙල කරන ලද මණ්ඩලයේ පරිපාටි සංග්‍රහයන් මණ්ඩලය විසින් යාවත්කාලීන කර නොතිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 පිරිවැය ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සඳහාවූ මණ්ඩලයේ විකුණුම් පිරිවැය පිළිබඳ විශ්ලේෂණයක් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත වගුවෙන් දැක්වේ.

| | වර්ෂය සඳහා වියදම | | වෙනස | % |
|---|---|---|---|---|
| | 2011 | 2010 | | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| විදුලිබල මධ්‍යස්ථාන ඉන්ධන ගිණුම | 24,982.470 | 16,350.498 | 8,631.771 | 53 |
| ස්වාධීන විදුලිබල ආයතන වලින් බලය මිලදී ගැනීම | 75,276.325 | 57,647.289 | 17,629.036 | 31 |
| පුනර්ජනනීය බලය මිලදී ගැනීම | 8,867.771 | 8,019.195 | 848.576 | 11 |
| කාර්ය මණ්ඩල වියදම | 11,745.872 | 11,635.701 | 110.171 | 1 |
| ද්‍රව්‍ය පිරිවැය | 12,989.753 | 5,124.311 | 7,865.441 | 153 |
| නවාතැන් පහසුකම් වියදම | 774.031 | 656.127 | 117.904 | 18 |
| ප්‍රවාහන හා සන්නිවේදන | 2,203.607 | 1,970.139 | 233.468 | 12 |
| ද්‍රව්‍ය මිල විචලනය | (2,919.687) | (1,785.179) | (1,134.508) | 64 |
| පොදු කාර්ය අයකිරීම් | (1,255.475) | (961.658) | (293.817) | 31 |
| ශ්‍රම රේට විචලනය | (803.281) | (548.037) | (255.244) | 47 |
| ක්ෂය | 18,297.458 | 15,990.333 | 2,307.126 | 14 |
| වෙනත් වියදම | 2,268.827 | 2,069.761 | 199.066 | 10 |
| විකුණුම් පිරිවැය | 152,427.470 | 116,168.481 | 36,258.989 | 31 |

ඉහත තොරතුරු වලට අනුව , මණ්ඩලයේ මුළු වියදමින් 70% ක් පමණ විදුලි බලය මිලදී ගැනීම හා උත්පාදනයට සෘජුවම අදාල වන බව අනාවරණය විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රමිත මිලට අගය කරන ලද ද්‍රව්‍ය පිරිවැය 153% කින් අසාමාන්‍යව වැඩිවී තිබුණි.

### 2.1.2 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළදී ලංකා විදුලිබල මණ්ඩලයේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු.මිලියන 19,266 ක බදු වලට පෙර පාඩුවක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු.මිලියන 4,832 ක් වූ බැවින් මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 24,098 කින් පිරිහීමක් දැක්වුණි. එම පිරිහීම සඳහා ප්‍රධාන හේතුන් පහත පරිදි විශ්ලේෂණය කෙරේ.

| විෂයය | 2011 | 2010 | වැඩිවීම / (අඩුවීම) | | පාඩුවට දායකය |
|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | % | % |
| විකුණුම් | 132,460 | 121,226 | 11,234 | 46.6 | 47 |
| ඉන්ධන | (31,992) | (16,551) | 15,441 | 93.3 | -64 |
| බලය මිලදී ගැනීම | (84,144) | (65,466) | 18,678 | 28.5 | -78 |
| මෙහෙයුම් හා නඩත්තු | (22,972) | (21,456) | 1,516 | 7.1 | -06 |
| මිල විචලනය | 4,978 | 3,295 | 1,683 | 51.1 | 07 |
| ක්ෂය | (18,297) | (15,990) | 2,307 | 14.4 | -10 |
| විකුණුම් පිරිවැය | (152,427) | (116,168) | 36,259 | 31.2 | |
| දළ ලාභය / ( පාඩුව ) | (19,967) | 5,058 | 25,025 | 494.8 | |
| වෙනත් ආදායම | 4,544 | 4,230 | 314 | 7.4 | 01 |
| මෙහෙයුම් වියදම | (3,842) | (4,456) | (614) | (13.8) | 03 |
| මෙහෙයුම් ලාභය / (පාඩුව) | (19,265) | 4,832 | (24,097) | (498.7) | 100 |

(අ) ජල විදුලි බලය උත්පාදනය අඩුවීම තාප විදුලි බලය උත්පාදනය වැඩිවීමට හේතුවී තිබුණු අතර අවසානයේ ඉන්ධන වෙනුවෙන් හා ස්වාධීන විදුලිබල සැපයුම්කරුවන්ගෙන් විදුලි බලය මිලදී ගැනීම වෙනුවෙන් මණ්ඩලයට විශාල වියදමක් දැරීමට සිදුවී තිබුණි. එම කරුණු දෙක හේතුවෙන් 2011 වර්ෂයේ පිරිවැය වැඩිවීම ඉකුත් වර්ෂයට එරෙහිව රු.මිලියන 15,441 ක් හා රු.මිලියන 18,678 ක් වූ අතර පිළිවෙලින් 64% කින් හා 78% කින් මුළු පාඩුව වැඩිවීමට එය දායකවී තිබුණි.

(ආ) 2011 වර්ෂයේ ක්ෂය ප්‍රතිපත්තිය වෙනස්වීම හේතුවෙන් රු.බිලියන 2 ක පමණ අතිරේක පිරිවැයක් ආදායම් ප්‍රකාශනයට අයකිරීමට මණ්ඩලයට සිදුවී තිබීම 10% කින් පාඩුව වැඩිවීමට හේතුවී තිබුණි.

(ඇ) ප්‍රමිත පිරිවැයට තොග විෂයයන් නිකුත් කිරීමේදී ඇතිවූ වාසිදායක මිල විචලනයන්ට අමතරව ඉල්ලුමේ සුළු වැඩිවීමක් හා 2011 වර්ෂයේ තීරු බදු සංශෝධන වල ප්‍රතිඵලයක් ලෙස රු.මිලියන 11,234 ක අතිරේක ආදායමක් උපයා තිබුණද , 2011 වර්ෂයේ මණ්ඩලයේ පාඩු තත්ත්වයක් ඉහත හේතුන් නිසා ඇතිවී තිබුණි.

### 2.1.3 ද්‍රවශීලතා තත්ත්වය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ ද්‍රවශීලතා තත්ත්වය පහත අනුපාත මගින් දැක්වේ.

| | අනුපාතය | 2011 | 2010 |
|---|---|---|---|
| (අ) | ජංගම අනුපාතය | 0.9:1 | 1.2:1 |
| (ආ) | ක්ෂණික වත්කම් අනුපාතය | 0.8:1 | 0.9:1 |
| (ඇ) | ජංගම බැරකම් වලට මුදල් හා බැංකු ශේෂය | 0.01:1 | 0.02:1 |

(අ) සහ (ආ) අනුපාතයන් පිළිවෙලින් 2.1 හා 1.1 යන සීමාව ඇතුළත පැවතිය යුතු බවට අපේක්ෂා කෙරේ.

ඉහත විශ්ලේෂණයට අනුව සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ ද්‍රවශීලතා තත්ත්වය ජල විදුලි බල උත්පාදනය අඩුවීම හේතුකොටගෙන ඉකුත් වර්ෂයට එරෙහිව එක්තරා මට්ටමකට පිරිහී තිබූ බව අනාවරණය විය.

## 2.2 මෙහෙයුම් සමාලෝචනය

### 2.2.1 විදුලිබල උත්පාදනය

සමාලෝචිත වර්ෂයේ විදුලිබල උත්පාදන විස්තර පිළිබඳ විශ්ලේෂණයක් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත වගුවෙන් දැක්වේ.

| මුලාශ්‍රය | 2011 | | 2010 | | වෙනස | |
|---|---|---|---|---|---|---|
| | ගිගා වොට් පැය (ගි වො පැ) | % | ගිගා වොට් පැය (ගි.වො.පැ) | % | ගිගා වොට් පැය (ගි.වො.පැ) | % |
| ජල විදුලි | 4,018 | 35 | 4,988 | 46 | -970 | -11 |
| තාප | 5,748 | 50 | 4,994 | 47 | 754 | 3 |
| ගල් අඟුරු | 1,038 | 9 | 0 | 0 | 1,038 | 9 |
| කුඩා ජල විදුලි | 604 | 5 | 646 | 6 | -42 | -1 |
| සුළං | 3 | 0 | 3 | 0 | 0 | 0 |
| සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලය (NCRE) | 118 | 1 | 83 | 1 | 35 | 0 |
| එකතුව | 11,529 | 100 | 10,714 | 100 | 815 | 0 |

ඉහත තොරතුරු අනුව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ජල විදුලිබල උත්පාදනය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී අඩු වැසි ලැබීම හේතුවෙන් ගි වො පැ (GWh) 4,988 සිට ගි වො පැ (GWh) 4,018 දක්වා 11% කින් පහත වැටී තිබුණි. කෙසේ වුවද එම අඩුවීම තාප හා ගල් අගුරු බලය මඟින් හිලව් කර තිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2011 වර්ෂයේ මුළු විදුලිබල උත්පාදනය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ගි වො පැ (GWh) 815 කින් වැඩිවී තිබුණි. ඒ අනුව විදුලිය කපා හැරීමෙන් තොරව ලංකා විදුලි බල මණ්ඩලයට එහි මෙහෙයුම් අඛණ්ඩව පවත්වා ගැනීමට හැකිවී තිබුණි.

(ආ) මණ්ඩලයට 2010 වර්ෂයේදී හරිත බල මූලාශ්‍ර වලින් රටේ සමස්ථ විදුලිබල ඉල්ලුමෙන් 53% ක් උත්පාදනය කිරීමට හැකිවී තිබුණද , 2011 වර්ෂයේදී 12% ක අඩුවීමක් පෙන්නුම් කරමින් එය 41% දක්වා අඩුවී තිබුණි.

### 2.2.2 විදුලි බලය විකුණුම්

2011 වර්ෂය සඳහා මණ්ඩලයේ සංඛ්‍යාත්මක සම්පිණ්ඩනයෙන් ( Statistical Digest ) ලබාගත් වටිනාකම් හා ප්‍රමාණයන් අනුව විවිධ වර්ගයේ පාරිභෝගිකයන් යටතේ වර්ගීකරණය කරන ලද විකුණුම් ආදායම් සම්බන්ධයෙන් තොරතුරු පහත වගුවෙන් දැක්වේ.

| පාරිභෝගික වර්ගය | පාරිභෝගිකයන් සංඛ්‍යාව | | ප්‍රමාණය ගි වො පැ වලින් | | විකුණුම් | | ඒකකයකට කිලෝ වොට් පැය විකුණුම් මිල |
|---|---|---|---|---|---|---|---|
| | | % | | % | රු.මිලියන | % | රු. |
| ගෘහස්ථ | 4,165,738 | 88 | 3,379 | 34 | 33,131 | 25 | 9.80 |
| ආගමික | 28,320 | 1 | 51 | 0 | 359 | 0 | 7.03 |
| සාමාන්‍ය කාර්යයන් | 475,380 | 10 | 1,927 | 19 | 41,674 | 32 | 21.63 |
| කර්මාන්ත හා හෝටල් | 48,008 | 1 | 3,290 | 33 | 42,328 | 32 | 12.87 |
| ලංවිස (LECO) | 1 | 0 | 1,267 | 13 | 14,968 | 11 | 11.81 |
| වීථි ආලෝකකරණය | 1 | 0 | 109 | 1 | - | - | - |
| | 4,717,448 | 100 | 10,023 | 100 | 132,460 | 100 | 13.22 |

ඉහත විශ්ලේෂණයට අනුව , ගෘහස්ථ කාර්යයන් සඳහා එදිනෙදා විදුලි බලය භාවිතා කරන ගෘහස්ථ පාරිභෝගිකයන් සංඛ්‍යාව මුළු පාරිභෝගික සමූහයෙන් 88% ක් නියෝජනය වන අතර මණ්ඩලයේ මුළු ආදායම සඳහා 25% ක දායකත්වයක් දරමින් 2011 වර්ෂයේදී විකුණන ලද ඒකක ප්‍රමාණයෙන් 34% ක් පරිභෝජනය කර ඇත. එහෙත් එම කාර්යය සඳහා සාමාන්‍ය විකුණුම් මිල ඉතා අඩුය. එබැවින් පරිභෝජනය ඉතා අඩු මට්ටමකට පවත්වා ගැනීම සඳහා විදුලි බලය ඉතිරි කිරීම උදෙසා දැනුවත් කිරීමේ වැඩ සටහන් උපරිම වැදගත්කමක් දරයි.

බැංකු, සමාගම් හා රජයේ කාර්යාල වැනි පාරිභෝගිකයන් සාමාන්‍ය කාර්යය පාරිභෝගිකයන් ලෙස වර්ගීකරණය කෙරේ. මුළු පාරිභෝගික සමූහයෙන් 10% ක් ඔවුන්ගෙන් නියෝජනය වන අතර මණ්ඩලයේ ආදායමට 32% ක දායකත්වයක් සපයමින් 2011 වර්ෂය සඳහා විකුණන ලද මුළු ඒකක ප්‍රමාණයෙන් 19% ක් පරිභෝජනය කර ඇත.

2011 වර්ෂයේ පාරිභෝගික සමූහයෙන් 1% ක් පමණක් කර්මාන්ත හා හෝටල් වලින් නියෝජනය විය. ඔවුන්ගේ පරිභෝජනය මුළු ඒකක විකුණුම් වලින් 33% ක් වුවද වර්ෂයේ ආදායමට දායකත්වය 32% ක් විය.

විකුණන ලද මුළු ඒකක ප්‍රමාණයෙන් 14% ක් පරිභෝජනය කරන ලද ඉතිරි 1% ක ප්‍රමාණය වෙනත් සියළු පාරිභෝගික වර්ගයන්ගෙන් නියෝජනය වූ අතර 2011 වර්ෂයේ ආදායමට 11% ක දායකත්වයක් සපයා තිබුණි.

2.3 මතභේදයට තුඩුදෙන කරුණු

---------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය සංස්ථා හා මණ්ඩල ඇතුළත් සියළුම රාජ්‍ය අංශයේ සංවිධානවල මූල්‍ය හා පරිපාලනය සම්බන්ධයෙන් ඒකාකාරි පරිපාටි හා පරිචයන් පවත්වා ගැනීමට වරින් වර රජය විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර චක්‍රලේඛ හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලංකා විදුලිබල මණ්ඩලයේ පරිපාලන රීති වශයෙන් අනුගමනය නොකරන්නේ නම් ඔවුන්ට ඒවා අදාල නොවන බවත් 1969 අංක 31 දරන පනතින් සංශෝධිත 1969 අංක 17 දරන ලංකා විදුලබල මණ්ඩල පනතට අනුකූලව තත්ත්වය පවත්වා ගෙන තිබුණු බවත් විගණනයේදී නිරීක්ෂණය විය. එවැනි උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

(i) 2008 ජුලි 01 සිට මණ්ඩලයේ සමස්ථ සේවකයන්ට ගෙවන ලද විශේෂ අතුරු දීමනාවට අදාලව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

* දීමනා අත්තිකාරමක් ලෙස ගෙවීමටත් 2009 ජනවාරි 01 සිට බලපැවැත්වෙන යෝජිත වැටුප් සංශෝධනයේදී එම දීමනාව අන්තර් ග්‍රහණය කර ගැනීමටත් මූලික තීරණය ගෙන තිබුණි. කෙසේ වුවද දීමනාව තවමත් අඛණ්ඩව ගෙවන අතර අත්තිකාරමට එරෙහි වැටුප් වැඩිවීම් ගිණුමේ 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිතව පැවති රු.මිලියන 235 ශේෂය සාමාන්‍යාධිකාරිගේ අනුමැතිය මත වැටුප් ගිණුමට මාරු කර තිබුණද ඔහුට එසේ අනුමත කිරීමට බලයක් නොතිබුණි.

* 1994 ජුනි 04 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව ගෙවීම කර තිබුණි.

* 2009 හා 2012 දී කරන ලද වැටුප් සංශෝධන සැලකීමේදී දීමනාව පිළිබඳ විස්තර වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 1998 මාර්තු 08 දිනැති අංක 130 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව වාහන ණය 10% සිට 14 % දක්වා පොලී ප්‍රමාණයකට ලබාදෙනු වෙනුවට මණ්ඩලය විසින් 4.2% ක පොලී ප්‍රමාණයට ලබාදී තිබුණි. තවද මණ්ඩලයට බරපතල ද්‍රවශීලතා ගැටළු ඇති වුවත් කිසිදු පාලනයකින් තොරව සේවක ණය ලබාදී තිබූ බව නිරීක්ෂණය විය.

(iii) 2007 දෙසැම්බර් 13 දින ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණ අංක සීපී/07/2116/332/050 අනුව ඊළඟ වැටුප් සංශෝධනයේ සිට උපයන විට ගෙවීම් බදු බැරකම සේවකයන්ට මාරු කිරීමට ගත් තීරණය ඉක්මවායමින් සේවකයින් විසින් දැරිය යුතු උපයන විට ගෙවීම් බදු බැරකම මණ්ඩලය විසින් දරමින් තිබුණි. එම අමාත්‍ය මණ්ඩල තීරණය ඉක්මවා යමින් 2010 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් ගෙවා තිබූ උපයන විට ගෙවීම් බදු ප්‍රමාණය රු.මිලියන 712 ක් විය.

(iv) 1994 ජුනි 04 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ දක්වා ඇති පරිදි අමාත්‍ය මණ්ඩලයෙන් හෝ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් හෝ මහා භාණ්ඩාගාරයෙන් අනුමැතියක් නොමැතිව වරින් වර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද පරිදි මණ්ඩලය විසින් විවිධ සේවක දීමනා වර්ග 39 ක් ගෙවා තිබුණි. රු.මිලියන 426 ක් වූ එවැනි දීමනා 2011 වර්ෂයේ ගෙවා තිබුණු බව විගණන නියැදි පරීක්ෂණයේදී අනාවරණය විය.

(ආ) ලබාගත හැකි වූ තොරතුරු අනුව මණ්ඩලය විසින් ආයෝජන තීරණ ගැනීමට මණ්ඩලයේ මූල්‍ය කළමනාකරුට බලය පවරා නොතිබුණද 1990 වර්ෂයේ සිට රක්ෂණ අරමුදලෙන් නව ආයෝජනයක් බාහිර වශයෙන් කිරීමට මණ්ඩලයේ මූල්‍ය කළමනාකරු තීරණය කර තිබුණි.

(ඇ) 2008 මාර්තු 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව , මණ්ඩලයේ පුනර්ජනනීය බලය පිරිවැයෙන් 10% ක් සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SEA) විසින් ආපසු ගෙවිය

යුතුය. කෙසේ වුවද 2008 වර්ෂයේ සිට ඉහත සඳහන් වැඩ පිළිවෙලට අනුව මණ්ඩලයට ලැබිය යුතු එම පුනර්ජනනීය බලය පිරිවැය සුනිත්‍ය බල ශක්ති අධිකාරිය විසින් ආපසු ගෙවා නොතිබුණි. 2011 දෙසැම්බර් 31 දිනට ආපසු ගෙවිය යුතු මුළු මුදල රු.මිලියන 897 ක් වේ. කෙසේ වුවද එය බැරකමක් වශයෙන් සුනිත්‍ය බලශක්ති අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර හෝ නොතිබුණු අතර ලංකා විදුලිබල මණ්ඩලය විසින් ශේෂය සනාථ කිරීමක් ලබාගෙන නොතිබුණි.

(ඇ) රක්ෂණ සංචිත අරමුදලේ ශේෂය හා රක්ෂණ සංචිත ආයෝජන අරමුදලේ ශේෂය අතර 2011 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 2,545 ක් වූ ඌනතාවයක් නිරීක්ෂණය විය. මණ්ඩලයේ ස්වයං රක්ෂණ ප්‍රතිපත්තිය ප්‍රකාරව ආයෝජනය සිදුකර නොතිබුණි.

(ඉ) මණ්ඩලය විසින් ලංකා විදුලි සමාගමට (LECO ) වර්ෂ කිහිපයක් තුළ විදුලි බලය විකුණා තිබුණද , එම පාර්ශ්වයන් දෙක අතර අලෙවි ගිවිසුමක් නොමැත. ඊට අමතරව ලංකා ඛනිජ තෙල් සංස්ථාවෙන් ඉන්ධන මිලදී ගැනීම පිළිබඳවද විධිමත් වැඩ පිළිවෙලක් නොවීය.

(ඊ) 2011 දෙසැම්බර් 31 දිනට ලංකා ඛනිජ තෙල් සංස්ථාවට ගෙවිය යුතු රු.මිලියන 60,133 ක මුදලින් රු.මිලියන 51,139 ක් වර්ෂයකට වඩා වැඩි කාලයක් හිඟ හිට තිබුණි. රු.බිලියන 52 ක් වූ ඉහත සඳහන් දීර්ඝ කාලීන හිඟ ශේෂය සඳහා වර්ෂ 5, 10 හා 20 යන කල් පිරිමේ කාලයක් සහිතව භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමටත් 2015 වර්ෂයෙන් ආරම්භ වී වර්ෂ 15 කට වැඩිකාලයකින් රු.බිලියන 3 ක වාර්ෂික වාරිකයක් මඟින් නිරවුල් කිරීමට ලංකා විදුලිබල මණ්ඩලයට හැකිවන පරිදි සහ බැඳුම්කර පිරිවැය ආපසු අයකර ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය හා ලංචිම අතර ගිවිසුමකට එළඹීමටත් අමාත්‍ය මණ්ඩලය විසින් 2011 ජූලි 28 දින මහා භාණ්ඩාගාරයට අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලංකා ඛනිජ තෙල් සංස්ථාවට ලැබිය යුතු රු.බිලියන 50.5 නිරවුල් කිරීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් 2012 ජනවාරි 09 දින ලංකා බැංකුවට භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කර එම දෙපාර්තමේන්තුවේ 2012 ජනවාරි 11 දිනැති අංක පීඩී/ඩීඑස් සහ ඒ / පීඩී /09/468 දරන ලිපිය මඟින් මණ්ඩලයට දන්වා තිබුණි. කෙසේ වුවද ඉහත තත්ත්වය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

2.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අවසන් කරන ලද (Finalized ) ණයගැතියන් - සාමාන්‍ය සැපයුම්

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැති ශේෂය රු.මිලියන 11,193 ක් වූ අතර, එයින් රු.මිලියන 1,062 ක් අවසන් ගෙවීම් දිනයේ සිට අවම වශයෙන් මාස 6 ක කාලය ඇතුළත පාරිභෝගිකයින්ගෙන් ලැබිය යුතු මුදල් නොගෙවීම හේතුවෙන් මණ්ඩලය විසින් විදුලි මනු ඉවත් කළ පාරිභෝගිකයන්ගෙන් ලැබිය යුතු හිඟ මුදල් විය. මේ සම්බන්ධයෙන් පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) වර්ෂ හයක කාල සීමාව ( Time Bar ) දැනටමත් ඉකුත්වී ඇති හෙයින් 2011 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 47 ක් වූ හිඟ ශේෂය සම්බන්ධ පාරිභෝගිකයන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට නොහැකි තත්ත්වයක මණ්ඩලය පැවතුනි.

තවද ආපසු අයකර ගත යුතු එකතුව රු.මිලියන 450 ක් වූ වෙනත් හිඟ ශේෂයන් ද වර්ෂ 6 ක කාලසීමාවට කෙටි කාලයක් තුළදී ලඟා වන බැවින් ඒවාද අයකර ගැනීම සැක සහිතය. කෙසේ වුවද එම ශේෂ අයකර ගැනීම සඳහා 2012 දෙසැම්බර් 31 දින වන විටත් පියවර ගෙන නොතිබුණි.

(ii) ඉහත සඳහන් රු.මිලියන 497 ට අමතරව , 2011 දෙසැම්බර් 31 දිනට හිඟව පැවති රු.මිලියන 655 කින් රු.මිලියන 126 ක්ද , 1999 දෙසැම්බර් 24 දින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි ( පාරිභෝගික සේවා ) විසින් නිකුත් කරන ලද අංක 1999-12 දරන චක්‍රලේඛයේ දක්වා ඇති අයකිරීම් ක්‍රියාවලියට අනුකූල නොවූ බැවින් අයකර ගැනීම සැකසහිතය. කෙසේ වුවද එම අඩුපාඩුකම් සඳහා වගකිව යුතු නිලධාරින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(iii) 1999 අංක 20 දරන ලංකා විදුලිබල පනතේ උපලේඛන II හි 1(4) උප වගන්තියට අනුව පාරිභෝගිකයකුගේ හිඟ මුදල් සම්පූර්ණයෙන් නිරවුල් කරන තුරු ඔහුගේ වෙනත් පරිශ්‍රයකට නව සම්බන්ධතාවයක් ලබා දෙනු නොලැබේ. කෙසේ වුවද එම අවශ්‍යතාවයට පටහැනිව, ඔවුන්ගේ බිල් හිඟයන් නොසලකා

නව සම්බන්ධතාවයන් ලබාදී තිබුණි. කෙසේ වුවද මේ දක්වා එවැනි වැරදි ක්‍රියාවන්ට එරෙහිව පියවර ගෙන නොතිබුණි. එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

| පළාත් කාර්යාලය | ගිණුම් අංකය<br>--------------<br>පැරණි සම්බන්ධතාවය | <br><br>නව සම්බන්ධතාවය | හිඟ මුදල |
|---|---|---|---|
| | | | රු. |
| නැගෙනහිර | 2402187506 | 2470100143 | 536,851 |
| | 3594268918 | 3594268810 | 361,309 |
| | 3504463309 | 3504463309 | 322,541 |
| ඌව | 3503514900 | 3570101614 | 833,004 |
| | 2304483003 | 2304291503, 2304291309<br>2304291406, 2304251005<br>2309048305, 2305402805 | 306,615 |

ඉහත නිරීක්ෂණයන්ට අනුව, ණයගැතියන් පිළිබඳ ණය පාලනය පමණක් නොව පාරිභෝගිතයන්ගෙන් ලැබිය යුතු මුදල් අයකර ගැනීම සඳහා කාලීනව පියවර නොගත් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමද ඉතා දුර්වල විය.

දීර්ඝ කාලයක් සුදුසු හා කාලීන පියවර ගැනීමෙන් තොරව මහජන මුදල් අයුතු ලෙස පරිහරණයට ඉඩදීමේ අවසාන ප්‍රතිඵලය වන්නේ තොරතුරු නොමැති බව, ගිණුම් කරණ දෝෂ , පාරිභෝගිකයා සොයා ගැනීමට නොහැකිවීම ආදී හේතු දක්වමින් ගිණුම් පොත් පත් වලින් ඒවා කපා හැරීමයි. මෑතදී වූ එවැනි කපා හැරීම් කිහිපයක් පහත දැක්වේ.

| කපා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ගත් දිනය | ශේෂය පිළිබඳ විස්තර | කපා හරින ලද මුදල |
|---|---|---|
| | | රු.මිලියන |
| 2001 | 1989- 1998 කාල පරිච්ඡේදයට අදාලව එකක් රු.4,000 ට අඩු සාමාන්‍ය සැපයුම් ශේෂ 57,389 | 37.78 |
| 2007 | 1989- 1998 කාල පරිච්ඡේදයට අදාලව එකක් රු.4,000 ට වැඩි සාමාන්‍ය සැපයුම් ශේෂ 9,675 | 206.03 |
| 2007 | 1999-2001 කාල පරිච්ඡේදයට අදාලව එකක් රු.4,000 ට වැඩි සාමාන්‍ය සැපයුම් ශේෂ 21,544 | 123.26 |
| 2007 | 1999-2001 කාල පරිච්ඡේදයට අදාලව තොග සැපයුම් ශේෂ 314 | 80.90 |
| | එකතුව | 447.97 |

මීට අමතරව , වෙළඳ ණයගැතියන් රු.මිලියන 401 ක් කපා හැරීම සඳහා තවත් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් සූදානම් කෙරෙමින් පවතී.

(ආ) හඳුනා ගැනීමට විමර්ශනය කිරීමෙන් තොරව හා වගකීම් පැවරීමට කටයුතු නොකර රු.මිලියන 22 ක් වූ තොග ඌනතා වර්ෂයකට වැඩි කාලයක් නිරවුල් නොකර පැවතුණි.

(ඇ) පුත්තලම වරායේ ගල් අඟුරු මෙහෙයවීමේ කටයුතු සඳහා ටග් බෝට්ටු හා බත්තල් ප්‍රසම්පාදනය කිරීම සඳහා රු.මිලියන 114 ක මුදලක් මණ්ඩලය වැය කර තිබුණු අතර එම වත්කම් වල පිරිවැය ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය යටතේ තවමත් කෙරීගෙන යන වැඩ ලෙස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත. කෙසේ වුවද ලංකා ගල් අඟුරු සමාගම (Lanka Coal Company ) ( මණ්ඩලයේ පරිපාලිතයකි ) එම වත්කම් ඔවුන්ගේ වරාය මෙහෙයුම් කටයුතු වලට යොදා ගන්නා අතර ගල් අඟුරු මෙට්රික් ටොන් එකකට එජඩො 2 බැගින් මෙහෙයුම් ගාස්තු මණ්ඩලයට අය කරයි. එසේ එම සමාගම විසින් අයකරන ලද ගාස්තුව 2011 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 102 ක් විය.

තවද සමාගමේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ ගල් අඟුරු මෙහෙයුම් කිරීම සඳහා ලයිටරින් උපකරණයක් ( Lightering Equipment ) නොතිබුණි. කෙසේ වුවද එම උපකරණයේ ක්ෂය සඳහා ගල් අඟුරු මෙට්රික් ටොන් එකකට එජඩො 1.70 ක් සමාගම අයකර තිබුණි. 2011 දෙසැම්බර් 31 දිනට එසේ අයකරන ලද මුදල රු. මිලියන 87 ක් විය.

වෙනම ආයතනයක් වශයෙන් ලංකා ගල් අඟුරු සමාගම ( මණ්ඩලයේ පරිපාලිතයකි ) ස්වයං මූල්‍යනයෙන් තොරව ඉන්වොයිසි මඟින් එසේ රැස්කරන අරමුදල් ලයිටරින් උපකරණ ආදේශ කිරීම සඳහා සංචිත ඇති කිරීමට හා ලයිටරින් උපකරණ නඩත්තු කිරීමට යොදා ගෙන තිබුණි. මණ්ඩලය බරපතල මූල්‍ය ගැටළු වලට මුහුණ දෙමින් සිටියදීත් මණ්ඩලය විසින්ද එවැනි අනවශ්‍ය වියදම් සඳහා ගෙවීම් කර තිබුණි.

( ඈ) 2010 වර්ෂයේදී ගල් අඟුරු ( Deaf Coal ) මෙට්රික් ටොන් 45,000 ක් මිලදී ගැනීම සඳහා රු.මිලියන 443 ක් ලංකා ගල් අඟුරු සමාගමට මණ්ඩලය විසින් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. එහෙත් සමාගම විසින් සම්පූර්ණ නැව් බඩු ප්‍රමාණය සපයා නොතිබූ අතර 2011 වර්ෂය අවසාන වන තෙක් ලබාදුන් අත්තිකාරම් වලින් රු.මිලියන 76 ක් හා රු.මිලියන 159 ක් පිළිවෙලින් සීමාසහිත ලංකා ගල් අඟුරු සමාගම හා සීමාසහිත ලංකා නැව් සමාගම රඳවා ගෙන තිබුණි. කෙසේ වුවද මණ්ඩලය විසින් මෙම අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ලංකා විදුලිබල මණ්ඩලයේ අවිධිමත් අරමුදල් කළමනාකරණය හේතුවෙන් , ඉහත (ඇ) සහ (ඈ) ඡේදයේ සඳහන් ක්‍රමයන් මඟින් මණ්ඩලයෙන් රැස්කර ගන්නා ලද අරමුදල් ආයෝජනය කිරීම මඟින් රු.මිලියන 55 ක ආයෝජන ආදායමක් සමාගම විසින් උපයා තිබුණි.

(ඊ) 2009 වර්ෂයේ සිට සමාගමෙන් ගල් අඟුරු මිලදී ගැනීම මණ්ඩලය විසින් අඛණ්ඩව සිදුකර තිබුණද ගල් අඟුරු මිලදී ගැනීම සඳහා ලංකා ගල් අඟුරු සමාගම සමඟ වානිජ ගිවිසුමකට හෝ අවබෝධතා ගිවිසුමකට මණ්ඩලය එළඹී නොතිබුණි.

(උ) එක් එක් කලාප වල ඉදිකිරීම් ශාඛා ඔවුන් භාර ගන්නා විදුලි බලය ලබා දීමේ කාර්යයන් සම්බන්ධයෙන් වාර්තා ආරම්භකව ඇස්තමේන්තු වටිනාකම් හා ප්‍රමාණයන්ට පවත්වනු

ලබන අතර මුල්‍ය අංශය තථ්‍ය වටිනාකම් හා ප්‍රමාණයන් මත ඔවුන්ගේ වාර්තා පවත්වා ගනු ලබයි. එබැවින් එම වාර්තා දෙවර්ගය සැසඳිය නොහැකිය.

2.5 හඳුනාගන්නා ලද පාඩු

---

හඳුනාගන්නා ලද පාඩු ලෙස සැලකිය හැකි සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී කපා හරින ලද බොල් ණය පිළිවෙලින් රු.මිලියන 226 ක් හා රු.මිලියන 1,513 ක් විය. විස්තර පහත දැක්වේ.

| | 2011 | 2010 |
|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන |
| වෙළඳ ණයගැතියන් | | |
| කලාප - 1 | 41 | - |
| ප්‍රධාන කාර්යාලය | 160 | 1,510 |
| වෙනත් ණය ගැතියන් | | |
| ප්‍රධාන කාර්යාලය | 25 | 3 |
| එකතුව | 226 | 1,513 |

2.6 ව්‍යාපෘති ප්‍රමාදය

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමනල වැව සුළු ජල විදුලි ව්‍යාපෘතිය - වර්ෂයකට ගි බො පැ (GWh) 10-2006 වර්ෂයට පෙර ආරම්භ කර තිබුණු අතර ජල කාන්දුවක් හේතුවෙන් එය අත්හිටුවා තිබුණි. ව්‍යාපෘතිය නිවැරදි කිරීමේ කාර්යය සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 200 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එය අධ්‍යයන මට්ටම යටතේ පැවතුණි.

(ආ) 2011 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු මගින් විදුලි බල පහසුකම් ව්‍යාපෘති 9 ක් සඳහා ලංකා විදුලිබල මණ්ඩලයට විදුලිබල හා බල ශක්ති අමාත්‍යාංශය යටතේ රු.මිලියන 4,022 ක මුදලක් රජය විසින් වෙන් කර තිබුණි. කෙසේ වුවද 2011 වර්ෂයේදී එම ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් සිදුකර නොතිබුණි.

2.7 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 වර්ෂයෙන් පසුව කාර්ය මණ්ඩල සංශෝධනයක් සිදුකර නොතිබුණි.

(ආ) මානව සම්පත් කළමනාකරණය සඳහා දත්ත ගබඩාවක් පවත්වා නොතිබුණි.

(ඇ) 2011 දෙසැම්බර් 31 දිනට තාක්ෂණ ශ්‍රේණිවල ප්‍රධාන තනතුරු පුරප්පාඩු 173 ක් පැවතුණි.

(ඈ) මණ්ඩලය විසින් යොදවාගත් කොන්ත්‍රාත්තු , තාවකාලික , බැහැරින් ලබාගත් සේවකයන් සඳහා අනුමත සේවක සංඛ්‍යාවක් නොවීය.

(ඉ) මණ්ඩලය විසින් පහළ ශ්‍රේණිවල කම්කරුවන් , කාර්යාල සහායකයින් හා සමාන්තර තනතුරු වල සේවකයන් සිරිතක් වශයෙන් අභ්‍යන්තර විභාග පරික්ෂණයක ප්‍රතිඵල මත ලිපිකරු ශ්‍රේණි වැනි ඉහළ තනතුරු වලට උසස් කරනු ලැබේ. මෙම පරිචය හේතුවෙන් අදාල තනතුරු වල පුහුණු නොමැති පුද්ගලයින් සේවයේ යෙදවීමක් වන අතර කාර්යක්ෂම කළමනාකරණයට එය අහිතකරව බලපා තිබුණි. එම හේතුවෙන් එහි ස්ථිර කාර්ය මණ්ඩලයට අතිකාල ආදිය ගෙවීමට අතිරේකව බාහිරින් සුදුසු මිනිස් බලය ප්‍රසම්පාදනය කර තිබුණි.

(ඊ) ප්‍රධාන තනතුරු සඳහා සම්පූර්ණයෙන්ම ජ්‍යෙෂ්ඨත්වය මත පදනම්ව කාර්ය මණ්ඩලය තෝරා ගැනීම හැරුණු විට ක්‍රමයක් විධිමත් අනුක්‍රම සැලැස්මක් නිරීක්ෂණය නොවීය. ආයතනයට වන අහිතකර බලපෑම සැලකීමෙන් තොරව විශ්‍රාම යන කාර්ය මණ්ඩලය සඳහා අනුග්‍රහයක් ලෙස නිලධාරින් කෙටි කාලයක් තුළ උසස් කර තිබුණි.

(උ) ඉහළ තනතුරු සඳහා ස්ථිර මාරු කිරීම් ප්‍රතිපත්තියක් නිරීක්ෂණය නොවීය.

## 2.8 සංයුක්ත සැලැස්ම

--------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව මණ්ඩලයේ සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කර නොතිබුණි.

## 2.9 විගණන කමිටුව

මණ්ඩලයේ විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් 4 දෙනෙකුගෙන් සමන්විත වූ අතර එයින් තිදෙනෙකු රජයේ ආයතන වලින් නියෝජනය වූ විධායක - නොවන සාමාජිකයන් විය. භාණ්ඩාගාර නියෝජිතයකු කමිටුවේ සභාපතිත්වය දරන අතර සමාලෝචිත වර්ෂය තුළදී රැස්වීම් 6 ක් පවත්වා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණන වාර්තා හා විගණකාධිපති වාර්තා සම්පූර්ණයෙන් සමාලෝචනය කර නොතිබුණි.

(ආ) අතුරු මූල්‍ය ප්‍රකාශන , විමර්ශන වාර්තා , මාසික මූල්‍ය හා භෞතික ප්‍රගතිය , අයවැය පාලන , මණ්ඩල තීරණ ක්‍රියාත්මක පිළිබඳ පසු විපරම් ක්‍රියාමාර්ග , ක්‍රියාකාරී සැලැස්ම , ප්‍රසම්පාදන සැලැස්ම ආදිය සමාලෝචනය කර නොතිබුණි.

## 2.10 අයවැය පාලනය

**අයවැය හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබු බව නිරීක්ෂණය විය.**

## 3. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) වත්කම් කළමනාකරණය
(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ
(ඇ) ඉන්වෙන්ට්‍රි පාලනය හා තොග කළමනාකරණය
(ඈ) මානව සම්පත් කළමනාකරණය
(ඉ) ගිණුම්කරණය හා මූල්‍ය කළමනාකරණය
(ඊ) ආයෝජන හා පරිපාලිතයන් පිළිබඳ පාලනය
(උ) කෙරීගෙන යන වැඩ
(ඌ) ව්‍යාපෘති කළමනාකරණය හා පාලනය

(එ) අයවැය

(ඒ) සේවක ණය

(ඔ) විකුණුම්